# ශ්‍රී ලංකාවේ බුදු දහම ස්ථාපිත වූ කාල පරාසයට නෑකම් කියන දැලිවල කොටවෙහෙර

**ඩී.එම්.ඩී.එල්. කුමාර**
අභයගිරි විහාර ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය.
*laksirimax007@gmail.com*

ප්‍රමුඛ පදඃ දැලිවල, කොටවෙහෙර, චෛත්‍යය, ජනප්‍රවාද

**හැඳින්වීම**

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දැලිවල කොටවෙහෙර රඹුක්කන - දොඹේමඩ හරහා කුරුණෑගල මාර්ගයේ රඹුක්කන සිට සැතපුම් තුනක් දුරින් පිහිටා ඇත. මහින්දාගමනයෙන් පසු මෙ රට ඉදි වූ මුල් ම චෛත්‍යවල ස්වරූපය හඳුනාගත හැකි නිදසුනක් වශයෙන් මෙය හඳුන්වා දිය හැකිය. හෙළයේ ඓතිහාසික සංසිද්ධීන් ලිඛිත සාක්ෂි මඟින් සනාථ කළ හැකි ග්‍රන්ථයක් වූ මහාවංශය ලියැවෙන්නේ අතීත අභිමානය හුවා දැක්වීම පිණිස වුවද ඊට වඩා පැරණි හා විශ්වසනීය තොරතුරු රහතන් වහන්සේලා ඇතුළු මිහිඳු හිමියන්ගේ කාර්යයන් සම්බන්ධයෙන් ලියැ වී ඇත්තේ සීහලවත්ථුප්පකරණයෙහි ය. ග්‍රාමයන්හි බුදු දහම ප්‍රචලිත වීම පිළිබඳ ව පාලි අට්ඨකථාවල සඳහන් වේ. මිහිඳු හිමියන්ගේ අනුශාසනය පරිදි නිම කරන ලදැයි පැවසෙන කොටවෙහෙර පිළිබඳ පූර්වකතනයක් පැරණි ග්‍රන්ථයක සඳහන් නොවන්නේ මේතාක් වූ පැරණි ම සාධකයක් නිසාවෙන් විය හැකිය. විහාර අස්න ග්‍රන්ථයට අනුව දැලිවල ග්‍රාමයේ ගරාවැටුණු චෛත්‍යයක් වේ. දඹදිව සිට පැමිණි රහතන් වහන්සේ නමක විසින් රෝපණය කළ බෝධියක් ඇත යනුවෙන් සඳහන් කිරීම මත මෙහි ඓතිහාසික බව සනාථ වේ (පඤ්ඤාවංශ 2009:02). මෙම ස්ථානය හා සම්බන්ධ ජනප්‍රවාද බොහොමයකි. පුරාවිද්‍යාත්මක සාධක ද තරමක් දුරට අනාවරණය වී ඇත. මෙම ස්ථානය සම්බන්ධයෙන් ජනප්‍රවාදයෙහි එන තොරතුරු පුරාවිද්‍යාත්මක ව කොතෙක් දුරට තහවුරු වේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටළුවයි. දැලිවල කොටවෙහෙර සම්බන්ධයෙන් පවතින ජනප්‍රවාද තොරතුරු හා පුරාවිද්‍යා සාධක අධ්‍යයනය කිරීම අරමුණ වේ.

**ක්‍රමවේදය**

ලිඛිත මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා මඟින් ලබා ගන්නා දත්ත ඇසුරින් ගුණාත්මක විශ්ලේෂණය

**විමර්ශනය**

දේවානම්පිය තිස්ස සමයේ සිටි ප්‍රාදේශීය පාලකයෙකු වූ තිස්ස කීර්ති නැමැත්තා විසින් රජුගේ අනුදැනුම මත මෙම චෛත්‍යය ඉදි කළ බව සඳහන් වේ (අමරසිංහ 2005:90). චෛත්‍යය නිර්මාණයේ දී එහි කොත සැකසීමට තැන වූ කොතෙහි සැලැස්ම සුළඟට ගොස් වැටුණු ස්ථානය කොත+වැල්ල = කොටවැල්ල වූ බව ජනප්‍රවාදයකි. මෙහි ධාතු නිදන් කිරීමේ උත්සවය සඳහා මිහිඳු මිහියන් වැඩි බවත් එහි දී මිහිඳු හිමියන් වැඩ සිටි ස්ථානය මිහිඳු+ඉම ලෙස හැඳින් වූ බවත් පසු කාලීන ව එය මීදුම ලෙස පරිවර්තනය වූ බවත් සඳහන් වේ (පඤ්ඤාවංශ 2009:02). උන් වහන්සේට දානය සැපයූ ග්‍රාමය මහ+දාන = මාදන ග්‍රාමය වී ලු. මිහිඳු හිමියන් ඇතුළු රහතන් වහන්සේලාට දානය රැගෙන ආ තවත් පිරිසක් දාන වේලාව පසු වී පැමිණ ඇත. එහෙයින් එම පෙදෙසේ පිරිස් හඳුන්වා ඇත්තේ දානේපහු වූ පිරිස ලෙස ය. කල්යත් ම එය දාහෙන්පහුව ග්‍රාමය බවට පත් විය. මිහිඳු හිමියන්ගේ අනුශාසනය පරිදි චෛත්‍යය නිර්මාණය සඳහා මෞර්ය වංශික අත්කම් ශිල්පීන් පැමිණ ඇති බවත්, මිහිඳු හිමියන් පැමිණි අවස්ථාවේ උන් වහන්සේගේ ආරක්ෂාව සඳහා මෙම පිරිස යොදාගත් බවත්, ඔවුන් සිටි ස්ථානය මෞර්ය+ගොඩ = මිරිහාගොඩ වූ බවත් ජනප්‍රවාදයකි (එම). වර්තමානයේ ද මෙම ගමේ බොහෝ පිරිස් පාරම්පරික ව කම්මල්කරුවන්, කුඹල්කරුවන්, වඩුවන් වේ. ජනප්‍රවාදයේ සඳහන් කරුණු අනුව දේවානම්පිය තිස්ස රජුගේ සමයේ දී මිහිඳු හිමියන්ගේ අනුශාසනාවෙන් මෙම චෛත්‍යය ඉදි කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

දැලිවල කොටවෙහෙර හා අවට භූමිය පිළිබඳ ව අවස්ථා කිහිපයක දී පුරාවිද්‍යා සමීක්ෂණ කටයුතු සිදු විය. 1982 බෙල් විසින් රචිත කෑගලු වාර්තාවට අනුව මෙහි වට ප්‍රමාණය අඩි 640 කි (අමරසිංහ 2005:91). 1957 දී සිදු කරන ලද කැනීමෙන් මෙම චෛත්‍යය, පිහිටි කන්දක් සමතලා කොට මැදින් ඉතිරි වූ කුඩා කඳු ගැටයක් වටා ගඩොලින් බැඳ ඇති බව තහවුරු විය (එම). මෙය එක් පේසාවක් සහිත ස්තූපයකි. ධාතු නිධානය කර ඇත්තේ ගර්භය හා පේසාව එක් තැන් මත බව ද ශ්‍රී ලංකාවේ වෙනත් කිසිම තැනක මෙවැනි දාගැබක් දක්නට නොමැති බව ද අනාවරණය විය. මෙහි ධාතු ගර්භයක් නොමැත. කැනීමෙන් හමු වූ පුරාවස්තු අතර වූ දඹරන් කරඬුව ප්‍රදක්ෂිණා පථය, ගර්භය, හතරැස් කොටුව, යූපය, ඡත්‍රය හා සිව්දිසා පතාක ආදියෙන් සමන්විත අංග සම්පූර්ණ කරඬුවකි. එය දඹදිව සාංචි ස්තූපයට සමාන වේ. රුවන්වැලි සෑයෙන් හා මිහිඳු මහා සෑයෙන් මෙවැනි කරඬු හමු වුව ද ඒවා අංග සම්පූර්ණ නොවේ (කුලතුංග 2004:04). මෙම කරඬුව හා චෛත්‍යය අතර ඇති සමානකම් අනුව කරඬුවේ දැක්වෙන ආකාරයට චෛත්‍යය නිර්මාණය වන්නට ඇති බවත්, ක්‍රිස්තු පූර්ව 1-2 සියවස්වලට මෙය අයත් විය හැකි බවත් අදහස් විය. කැනීමෙන්

පළිඟු කරඬු 168ක් හමු වූ අතර එහි ද දක්නට ඇත්තේ එක් පේසාවක් පමණි. මීට අමතරව ගල් කරඬු, මැටි කරඬු ද හමු වූ අතර චෛත්‍යයට අයත් ගඩොල්වල ස්වභාවය අනුව ඒවා ක්‍රි.පූ. 1-2 සියවස් නියෝජනය කරන බව තහවුරු විය (පඤ්ඤාවංශ 2009:04).

මුල් කැනීමෙන් වසර 44කට පසු 2001 වර්ෂයේ නැවත මෙම ස්තූපයෙහි කැනීමක් පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවේ මෙහෙය වීමෙන් සිදු විය. මෙම කැනීම මෙරට ඉතිහාසයට නව පරිච්ඡේදයක් එක් කිරීමට සමත් වූයේ ආසියාවෙහි පළමු හා පැරණිතම සේද සළුව මෙම ස්තූපයෙන් හමු වීමෙනි. මෙම සළුව ලෝහ කරඬුවක් වසා තිබී හමු වූ අතර එය පබළු ගෙත්තමෙන් අලංකෘත වී තිබී ඇත (එම). ලෝහ කරඬුවේ තිබී සොයාගත් මෙම සළුවෙහි සාම්පල් කිහිපයක් ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජුඩිත් කැමරන් නැමති පෞරාණික රෙදිපිළි පිළිබඳ විශේෂඥවරිය විසින් විශ්ලේෂණය කිරීමෙන් පසු කාබන් 14 පරීක්ෂණයට යොමු කර එය අදින් වසර දෙදහස් දෙසීයක් පැරණි බව තහවුරු කරන ලදී. මෙම කැනීමෙන් ය, ධ යන බ්‍රාහ්මීය අක්ෂර හා සටහන් සහිත ගඩොලක් ද හමු විය. මෙම අක්ෂර හා සටහන් ලක්ෂණ අනුව ඒවා ක්‍රි.පූ. පළමු සියවසට අයත් බවට තහවුරු විය (අමරසිංහ 2005:90). මීට අමතරව අනුරාධපුර මුල් කාලයට අයත් කාසි කිහිපයක් ද, රන් ආභරණ කිහිපයක් ද, ලෝහ හා පළිඟු කරඬු කිහිපයක් ද හමු විය. මෙම කැනීමෙන් ලබා ගත් අඟුරු සම්පල කාබන් 14 පරීක්ෂාව සඳහා ඇමෙරිකාවට යවන ලද අතර එහි ප්‍රතිඵලය වූයේ වසර දෙදහසක් පැරණි බවයි (පඤ්ඤාවංශ 2009:05).

**නිගමනය**

1957 වර්ෂයේ හා 2001 වර්ෂයේ කැනීම් තුළින් ලැබෙන සාධක විශ්ලේෂණය කිරීමෙන් මෙම චෛත්‍යය නිසැකව ක්‍රිස්තුපූර්ව පළමු සියවසෙන් ඔබ්බට දිවෙන බව පැහැදිලි ය. ජනප්‍රවාදයන්ට අනුව මිහිඳු හිමියන්ගේ ජීවමාන කාලය තුළ මෙය ඉදි වී ඇත. ජනප්‍රවාදයෙහි එන කරුණු හා පුරාවිද්‍යාත්මක සාධක අතර යම් සමානකමක් දක්නට ලැබෙන අතර මෙම ස්ථානය සම්බන්ධයෙන් ජනප්‍රවාදයෙහි එන තොරතුරු පුරාවිද්‍යාත්මක ව තහවුරු වන බැවින් දැලිවල කොටවෙහෙර ඉදි කරන ලද්දේ මිහිඳු හිමියන්ගේ ජීවමාන කාල පරාසය තුළ බව විශ්වාස කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අමරසිංහ, මාලිංග, ශ්‍රී ලංකාවේ පුරාණ ස්තූපය, 2005, ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ 10.

කුලතුංග, ටී.ජී. ලංකාවේ ස්තූපය, 2004, තරංජි ප්‍රින්ට්ස්, මහරගම.

පඤ්ඤාවංශ, කිවුල්පනේ, දැලිවල කොටවෙහෙර ඓතිහාසික තොරතුරු, අත්පත්‍රිකාව, 2009, සිතාරා ප්‍රින්ට්ස්, රඹුක්කන